
# 7 පරිච්ඡේදය

# වෙළෙඳාම ප්‍රවාහනය හා සන්නිවේදනය

වර්තමාන ලෝකය එක ම විශ්ව ගම්මානයක් ලෙස සැලකිය හැකි තරමට අද අන්තර් මානුෂ සම්බන්ධතාවන් වර්ධනය වී ඇත. අතීතයේ ස්වයංපෝෂිත ජන සමාජවල පදනමින් ඇති වූ සරල හුවමාරු ක්‍රම සමඟ බැඳුණු මෙවැනි සම්බන්ධතාවන් අද වන විට බෙහෙවින් ම සංකීර්ණ තත්ත්වයකට පත් වී තිබේ. තවමත් විවිධ රටවල ගෝත්‍රික ජන කණ්ඩායම් ජීවත් වුව ද ඔවුන්ගේ ක්‍රියාකාරකම්වල දී, ජීවත් වන ප්‍රදේශයෙන් ඔබ්බෙහි වූ ගම් නගර සමඟ සබඳතා පවත්වා ගන්නා බව පෙනේ. එද සිට අද දියුණුයයි සම්මත මිනිසා දක්වා ම අන්තර් මානුෂ ක්‍රියාකාරකම් සඳහා විවිධ ක්‍රමවේද අනුගමනය කළ බවට සාධක හමු වේ.

පෘථිවි තලය මත පිහිටි විවිධ වූ විෂමතා හා වෙනත් භෞතික බාධාවන් ද මිනිස් වර්ගයා ජාති, ආගම්, කුළ, ගෝත්‍ර හා දේශපාලන ඒකක වශයෙන් බෙදීමට හේතු වී තිබේ. ගම්, ජනපද, ප්‍රදේශ, ප්‍රාන්ත, රාජ්‍ය වශයෙන් සීමා පනවා ගෙන කොටු වී සිටින බවක් අතීතයේ සිට ම දක්නට ලැබුණි.

එසේ වුව ද ඉහත සීමා බාධක බිඳ ගෙන අන්තර් ක්‍රියාකාරකම් ඉටු කර ගැනීමේ අවශ්‍යතාව අද ජය ගෙන ඇත. වෙළෙඳාම, ප්‍රවාහනය හා සන්නිවේදනය එහි උදව්කරුවන් බවට පත් ව තිබේ.




මිනිසා ඒකරාශි වූ සෑම ස්ථානයක ම නීති, රීති චාරිත්‍ර හා සම්ප්‍රදයයන් ක්‍රියාත්මක වේ. සංකීර්ණ වූ මානුෂ ක්‍රියාකාරකම් ඉටු කර ගන්නා මාධ්‍යයන් වන වෙළෙඳාම, ප්‍රවාහනය හා සන්නිවේදනයට ද මිනිසා විසින් පිළිගත් හා පනවාගත් නීති, සම්ප්‍රදයන්, සම්මතයන් ඇතුළත් වේ. අතීතයේ සිට ක්‍රමක්‍රමයෙන් දියුණු වෙමින් ආ වෙළෙඳාම, ප්‍රවාහනය හා සන්නිවේදනය මතු අනාගතයේ තව දුරටත් වෙනස්කම්වලට භාජනය වෙමින් මානුෂ ක්‍රියාකාරිත්වයේ මාධ්‍යයන් ලෙස පවතිනු ඇත.

## 7.1 වෙළෙඳාම

විෂයභාර ගුරුතුමා දී තිබුණු උපදෙස් අනුව 11 ශ්‍රේණියේ භූගෝල විද්‍යාව හදරන සිසුන් යා යුතු ව තිබුණේ තොරතුරු තාක්ෂණ කාමරයට යි. සීනුව නාද වූ විගස ම විෂය නායකගේ උපදෙස් අනුව සිසුහු පේළියට තොරතුරු තාක්ෂණ කාමරයට ගොස් ගුරුතුමාට ආචාර කර අසුන් ගත්හ.

ගුරුතුමා : "අද පුතාලට කෙටි චිත්‍රපටියක් බලන්න පුළුවනි. හොඳින් අහන්න, බලන්න සිදු වන ක්‍රියාකාරකම් මොනව ද කියල" යනුවෙන් පැවසූ ගුරු මහතා පරිගණක යන්ත්‍රය ක්‍රියාත්මක කළේ ය.

සිසුනට ඇසීමට හා දැකීමට හැකි වූ දේ පහත දැක්වෙන කොටුව තුළ සැකෙවින් දැක්වේ.

ගමේ ගොඩේ සිදුදියේ කවුරුත් පාහේ
බඩු ගන්නයි විකුණන්නයි පොළටයි ආවේ//

පසුබිම් ගීත හඬ මැකීයත් ම ගම්බද වෙළෙඳපොළක දර්ශනයක් තිරයේ දිග හැරෙන්නට වුණා.

- ලාබයි ලාබයි ගොඩ ම පනහයි..........ගොඩ ම පනහයි
- ආ එන්න ගන්න මේවා නුවරඑළියෙ ඒවා
- රාබු ලාබයි, රාබු ලාබයි, කිලෝව 25/= යි පන්සියය 15/= යි.
- ආ ටිකට් එක. පොළ කාසි රු. 50/= ක් දෙන්න.
- අනේ බොස් බඩු දැම්ම විතරයි. තවම බිස්නස් උනේ නෑ
- මේ මේ ටක්ගාල දෙනව, මේ ලයින් එකේ ආයෙත් එන්න බෑ.
- ආ එන්න නෝනා, ගමේ එළවළු, ගමේ පලා ලාබයි ලාබයි.

බලන්න වුනේ එපමණයි. විදුලිය විසන්ධි වීම ගැන සිසුන්ට හරිම කණගාටුයි.

ගුරුතුමා : වුවමනා ප්‍රමාණය පුතාලට බලන්න පුළුවන් වුණානේ...........පුතාල මොනව ද ඒ දර්ශනවල දැක්කෙ?

සිසුන් : වෙළෙඳපොළක්, වෙළෙඳපොළක්, එක හඬින් පිළිතුරු ලැබුණා.

ගුරුතුමා : හරි එහෙනම් පුතාලා මට කියන්න දුටුව ඇසුණ සිද්ධි, දේවල් මොනවද කියල.

සිසුන් ඉදිරිපත් කළ අදහස් ගුරුතුමා අතින් හුණු පුවරුවේ මෙලෙස සටහන් කෙරුණි.

- බඩුගන්න මිනිස්සු ඇවිත් හිටියා.
- බඩු විකුණන වෙළෙන්දෝ හිටියා.
- ගොවියො ඒ අය වවාපුව අරන් ඇවිත් හිටියා.
- වාහන තිබුණා.
- වාහනවලට බඩු පටවනව, සමහර බඩු පිරවූ ප්ලාස්ටික් කූඩ බානවා.
- තමන්ගේ බඩු විකුණගන්න වෙළෙන්දෙ කෑගහනවා.
- මිනිස්සු බඩු තෝර තෝර ගන්නවා.
- කිරනව, මනිනවා.
- පොළ අයිතිකාරයො බදු ගන්නවා.
- ස්වීප් වෙළෙන්දෙකුත් ඒ අතරෙ හිටියා.

ගුරුතුමා, මේ ලියපු ලැයිස්තුව හොඳින් කියවල බලන්න. අපේ අවශ්‍යතා ඉටු කර ගන්න තැනක් තමයි මේ,

**ක්‍රියාකාරකම:**

මෙහි නීති, සම්මතයන්, ප්‍රචාරණය, ප්‍රවාහනය, මුදලට භාණ්ඩ හුවමාරුව, අවශ්‍යතා ඉටුකිරීම් කොපමණ තිබේ ද? ඔබත් විෂයභාර ගුරුතුමා සමඟ මේ එක් එක් කරුණ ගැන සාකච්ඡා කර තොරතුරු සටහන් කර ගන්න.

මේ දර්ශනයෙන් අපට අනාවරණය වූයේ මානුෂ අන්තර් ක්‍රියාවන් කර ගෙන යාමට මූලික වූයේ

- වෙළෙඳාම,
- ප්‍රවාහනය සහ
- සන්නිවේදනය බව ය.

**අනතුරුව ලෝක වෙළෙඳම කෙරෙහි බලපාන සාධක කීපයක් ම සාකච්ඡා කරන ලදි.**
මෙම සාකච්ඡාවේ දී මතු වූ වැදගත් කරුණු කීපයක් පහත දැක්වේ.

- පවුලකට, ගමකට, ප්‍රදේශයකට අවශ්‍ය සියලු භාණ්ඩ එම ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට ම නිපදවා ගත නොහැකි වීම.
- මිනිසා විසින් සිදු කළ නව සොයා ගැනීම් නිසා නිෂ්පාදන අතිරික්ත ලබා ගත හැකි වීම.
- තාක්ෂණයේ දියුණුව නිසා භාණ්ඩ නිෂ්පාදනය සහ හුවමාරුව වේගවත් වීම.
- දේශගවේෂණ කටයුතුවල දියුණුව නිසා ලෝකය පුළුල් වීම.
- නිමිද්‍රව්‍ය විකිණීමටත්, අමුද්‍රව්‍ය සපයා ගැනීමටත්, යටත් විජිත පිහිටුවීම.
- සම්පත් අසම ලෙස ව්‍යාප්ත වීම.
- ප්‍රවාහනය හා පණිවිඩ හුවමාරුවේ දියුණුව.
- ලොව සමහර රටවල් සාපේක්ෂ වාසි නිසා යම් යම් නිෂ්පාදන සඳහා විශේෂකරණයක් ගොඩනගා ගෙන තිබීම.

- මුදල් භාවිතයේ දියුණුව සමග චෙක්පත්, විද්‍යුත් මුදල් සංසරණය වේගවත් වීම.
- සමහර භාණ්ඩ නිෂ්පාදනයට විවිධ ජාතීන්, රටවල්, කීර්තියක් හිමි කර ගැනීම.
- ජන සංඛ්‍යාවේ වේගවත් වර්ධනය නිසා, මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම සහ වෙළෙඳ, ප්‍රවාහන සහ සන්නිවේදන මාධ්‍යයන්ගේ ඇති වූ දියුණුව.
- ඇතැම් රටවල ඇතැම් භාණ්ඩ සම්බන්ධයෙන් විශේෂ ප්‍රාගුණ්‍යයක් ඇති කර ගෙන තිබීම.

කාලය අවසන් වීමේ සීනුව නාද වීමත් සමඟ ගුරුතුමා ගෙදර වැඩට ප්‍රශ්නයක් ඉදිරිපත් කොට පාඩම නතර කළේ ය.


පසුවැඩට
අතීතයේ දියුණු වෙළෙඳාමක් නොපැවතුණේ ඇයි?

පසු දින සිසුන් උදෑසන පැමිණි පිළිවෙළට ඒ අය සොයා ගෙන ආ තොරතුරු බ්‍රිස්ටල් බෝඩ් එකක ඒ ඒ අය විසින් ම මෙසේ සටහන් කර තිබුණි.

**අතීතයේ දියුණු වෙළෙඳාමක් නොපැවතුණේ ඇයි ?**

- අතීත මිනිසුන්ගේ අවශ්‍යතා සීමිත වීම.
- ඔවුන්ගේ අවශ්‍යතා සරල වීම.
- ඔවුන්ගේ තාක්ෂණ දැනුම අඩු වීම.
- ඥාතීන් හිතවතුන් දුර බැහැර ප්‍රදේශවල නො සිටීම.
- සීමිත ජන සංඛ්‍යාවට අවශ්‍ය සම්පත් ඔවුන්ගේ ප්‍රදේශ තුළ ම පැවතීම.
- අවශ්‍ය සම්පත් ආසන්න ප්‍රදේශයෙන් සපයා ගත හැකි වීම.
- සාමූහික ව ඔවුන්ගේ අවශ්‍යතා ප්‍රදේශයෙන් ම සපුරා ගැනීම.
- ප්‍රවාහන පහසුකම්වල අඩු බව හා අනතුරු සහිත වීම.
- ප්‍රචාරණය සහ සන්නිවේදනය දියුණු මට්ටමක නො පැවතීම.
- මුදල් භාවිතය නොමැති වූ නිසා තමා නිපද වූ භාණ්ඩ වෙනත් අයගේ භාණ්ඩවලට හුවමාරු කිරීම.

අතීතයේ දී අත්‍යවශ්‍ය භාණ්ඩ රටවල් අතර හුවමාරු නො වීම නිසා දියුණු වෙළෙඳමක් රටවල් අතර නො පැවතුණ ද, මුතු මැණික්, සුවඳ විලවුන් ඇත් දළ වැනි සුඛෝපභෝගී ද්‍රව්‍ය වෙළෙඳමක් පෙර, අපර දෙදිග රටවල් අතර පැවතිණ. ඒ බව 7:1 සිතියම තුළින් පැහැදිලි වේ.





**7.1 සිතියම : 15 සියවසට පෙර පැවති වෙළෙඳ මාර්ග**

**ගොඩබිම් මාර්ග**     **මුහුදු මාර්ග**

මූලාශ්‍රයඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව 2005, 8, ශ්‍රේණිය ඉතිහාසය හා 10 ශ්‍රේණිය සමාජ අධ්‍යයනය හා ඉතිහාසය පෙළ පොත් ඇසුරෙනි.

## ලෝක වෙළෙඳාම රටවල් අතර බෙදීයාම

ලෝක වෙළෙඳාම රටවල් හා ප්‍රදේශ අතර බෙදී ගොස් ඇත්තේ අසමාන අයුරින් ය. පහත දැක්වෙන 7.1 රූපය අධ්‍යයනය කිරීමේ දී එය වඩාත් තහවුරු වේ.




**7.1 රූපය : ලෝකයේ ප්‍රදේශ අතර ආනයන හා අපනයන බෙදී ගිය අයුරු 2005**


CIS = ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල්

මූලාශ්‍රයඃ ලෝක වෙළෙඳ සංවිධානය, 2006 ලෝක වෙළෙඳ වාර්තාව

7.1 රූපය අනුව 2005 දී ලොව ආනයන අපනයනවලින්,

- වැඩි ම ප්‍රතිශතය යුරෝපා රටවල් හිමි කර ගෙන ඇත.
- සංවර්ධනය වෙමින් පවතින රටවල ප්‍රතිශතය ඉතා අඩු ය.
- අප්‍රිකානු රටවලට හිමි වන්නේ ඉතා ම අඩු ප්‍රතිශතයකි.

2010 වර්ෂයේ ලෝක වෙළඳාම පිළිබඳව සැලකීමේදී ආසියාවේ ශීඝ්‍ර අපනයන වර්ධනයක් පෙන්නුම් කෙරේ. ආසියානු රටවල් අතරින් චීනය, ජපානය, ඉන්දියාව වැනි රටවල් ලෝක වෙළෙඳාමට විශාල වශයෙන් දායක වී ඇත.




**7.2 සිතියම : වෙළෙඳාම මත යැපීම**

මූලාශ්‍රයඃ එම්. ඩී ගුණසේන, 2003, නවීන ගුණසේන ෆිලිප් ලෝක සිතියම් පොත

7.2 සිතියම අධ්‍යයනය කිරීමෙන් ලොව බොහෝ රටවල් වෙළෙඳාම මත යැපෙන බව අනාවරණය වේ. එකිනෙක රටවල් සතු ව ඇති සම්පත් ප්‍රමාණය, සම්පත්වල සුවිශේෂ බව, සම්පත්වල වටිනාකම, ජන සංඛ්‍යාව, කාර්මික දැනුම හා නිෂ්පාදන අතිරික්ත ලබා ගැනීමේ හැකියාව ආදී කරුණු අනුව රටවල් අතර වෙළෙඳාමේ ස්වරූපය අවබෝධ කර ගත හැකි ය.

**ක්‍රියාකාරකම්**

1. ලෝක සිතියමක සංවර්ධිත රටවල් පහක් හා සංවර්ධනය වෙමින් පවතින රටවල් පහක් ලකුණු කර නම් කරන්න.
2. එම රටවල් ආනයනය කරන හා අපනයනය කරන භාණ්ඩ දැක්වෙන වගුවක් සකස් කරන්න.
3. එම රටවල් සම්බන්ධ කෙරෙමින් විහිදෙන නැව් මාර්ග ලෝක සිතියමක ඇඳ දක්වන්න.

**ලෝක වෙළෙඳාමේ පරතරය හෙවත් වෙළෙඳ ශේෂය**

- ආනයන වියදම හා අපනයන ආදයම අතර පරතරය වෙළෙඳ ශේෂය යි. එය ධන හෝ ඍණ (වාසි හෝ අවාසි) අගයක් විය හැකි ය.
- සංවර්ධිත රටවල් වෙළෙඳ ශේෂය වාසිදයක කර ගැනීමට සැපයුම සීමා කිරීම, භාණ්ඩ හිඟයක් මවා පෑම, මිල තීරණයට බලපෑම් කිරීම, වැනි උපක්‍රම අනුගමනය කරනු ලබයි.
- සංවර්ධනය වෙමින් පවතින රටවල් ප්‍රාථමික නිෂ්පාදන (කෘෂි හෝ කාර්මික අමුද්‍රව්‍ය) වෙළෙඳපොළට ඉදිරිපත් කරයි. ඒවාට ආදේශන ඇත. ඉදිරිපත් කරන්නේ තොග වශයෙනි. සැපයුම්කරුවන්ට මිල තීරණය කළ නොහැකි ය. වාර්ෂික ව පාඩු විඳී.
- ඛනිජතෙල් මිල ඉහළ යාම නිසා ඛනිජ තෙල් ආනයනය කරන සංවර්ධිත රටවල වෙළෙඳ ශේෂය මෑතක සිට ඍණ අගයක් ගනී.
- සංවර්ධනය වෙමින් පවතින සමහර රටවල නිෂ්පාදන සඳහා සංවර්ධිත රටවල් ආදේශන භාණ්ඩ නිපදවීම හා ඒවා පරිභෝජනයට නැඹුරු වීම.

ඉහත දැක්වෙන කරුණු තවදුරටත් තහවුරු කර අධ්‍යයනය කිරීමට පහත දැක්වෙන "වෙළෙඳ ශේෂය" පිළිබඳ සිතියම උදව් කරගත හැකි ය.



7.3 සිතියම : වෙළෙඳ ශේෂය

මූලාශ්‍රය: එම්. ඩී ගුණසේන, 2003, නවීන ගුණසේන ෆිලිප් ලෝක සිතියම් පොත

**ලෝක වෙළෙඳාමේ නව ප්‍රවණතා**

- සංවර්ධිත රටවල් වැඩි වශයෙන් කාර්මික නිමිද්‍රව්‍ය අපනයනය කිරීම.
- සංවර්ධනය වෙමින් පවතින රටවල් වැඩි වශයෙන් ප්‍රාථමික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන භාණ්ඩ වෙළෙඳපොළට යොමු කිරීම හා අපනයන විවිධාංගීකරණයට යොමු වීම.
- ලෝක වෙළෙඳාමට බහු ජාතික සමාගම් කරන බලපෑම වැඩි වීම.
- විද්‍යුත් මාධ්‍ය මඟින් මුදල් හුවමාරුව.
- ගබඩා කිරීම්වලින් තොර ව කර්මාන්ත ශාලාවෙන් කම්හලින් ඍජු ව පාරිභෝගිකයා අතට භාණ්ඩ පත් කිරීම.
- සන්නිවේදන ජාල මඟින් ඍජු ව ම වෙළෙඳපොළ හැසිරවීම.
- සුවිශේෂ අපනයන භාණ්ඩ වර්ග කීපයක් මත රටක ආර්ථිකය පවත්වා ගෙන යා හැකි වීම.
- සංවර්ධනය වෙමින් පවතින සමහර රටවල නිෂ්පාදන කර්මාන්ත වැසී යාම හා ඒවාට අදාළ වෙළෙඳපොළ අහිමි වීම.
- වෙළෙඳ ගිවිසුම්, වෙළෙඳ සංවිධාන, වෙළෙඳ හවුල් ඇති කර ගැනීමට ලොව රටවල් පෙළඹීම.
- පාරිභෝගික අවශ්‍යතාවන් සපුරාලීමට වඩා ලාභ අපේක්ෂාව ඉස්මතු වීම.
- නව කාර්මික රටවල් වැඩිපුර ම ලුහු පාරිභෝගික භාණ්ඩ වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමට නැඹුරු වීම.
- අමුද්‍රව්‍ය ලබා ගැනීමටත්, කාර්මික නිමිද්‍රව්‍ය අලෙවියටත් සංවර්ධිත රටවල් විශාල වශයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල් සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම. නිදසුන් : චීනය, ඉන්දියාව, ජපානය

**ලෝක වෙළෙඳාමේ ගැටලු හා අනුගමනය කර ඇති විසඳුම්.**

අන්තර් ජාතික වෙළෙඳාමේ දී සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් භේදයකින් තොර ව විවිධ ගැටලුවලට මුහුණ දෙන අතර ම ඒවාට කාලීන විසඳුම් සකසා ගනිමින් වෙළෙඳාම කර ගෙන යනු ලබයි. එවැනි ගැටලු කීපයක් හා විසඳුම් කීපයක් පහත වගුවේ දක්වා ඇත.

| සංවර්ධිත රටවල් මුහුණ දෙන ගැටලු | අනුගමනය කර ඇති විසඳුම් |
|---|---|
| • ඛනිජ තෙල් මිල ශීඝ්‍රයෙන් ඉහළ යාම නිසා කාර්මික නිෂ්පාදනවල මිල ඉහළ යාම.<br>• සංවර්ධනය වෙමින් පවතින රටවල් තම රටවල කර්මාන්ත ආරම්භ කිරීම නිසා සංවර්ධිත රටවල අමුද්‍රව්‍ය මූලාශ්‍ර සීමා වීම. | • වෙළෙඳ හවුල් පිහිටුවා ගැනීම, නව වෙළෙඳපොළවල් සොයා ගැනීම.<br>• ද්වි පාර්ශවික වෙළෙඳ බැඳීම් ඇති කර ගැනීම.<br>• ආදේශනවලට නැඹුරු වීම. |

| සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණ දෙන ගැටලු | අනුගමනය කර ඇති විසඳුම් |
|---|---|
| • වෙළෙඳ ද්‍රව්‍ය සඳහා සාධාරණ මිලක් නො ලැබීම.<br>• බහුජාතික වෙළෙඳ සමාගම්වල බලපෑම.<br>• සංවර්ධිත රටවලින් කරන බලපෑම. (සම්භාධක පැනවීම වැනි)<br>• සාම්ප්‍රදායික වෙළෙඳපොළ අහිමි වීම. | • වෙළෙඳ ගිවිසුම්, වෙන්දේසි ක්‍රමය අනුගමනය කිරීම<br>• වෙළෙඳ ප්‍රදර්ශන පැවැත්වීම.<br>• තරඟකාරි ලෙස දේශීය නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම<br>• කලාපීය සංවිධාන පිහිටුවා ගැනීම.<br>• තරඟකාරි නව වෙළෙඳ පොළවලට පිවිසීම. |

ඒ ඒ රටවල් කාණ්ඩ එකතු වී සංවිධානය කර ගත් වෙළෙඳ සංවිධාන කීපයක් පහත වගුවේ සඳහන් වේ.

| රටවල් කාණ්ඩය | රටවල් | වෙළෙඳ සංවිධාන හා හවුල් |
|---|---|---|
| සංවර්ධිත රටවල් | බ්‍රිතාන්‍ය, ජර්මනිය, ප්‍රංශය ආදී රටවල් | යුරෝපා පොදු වෙළෙඳ හවුල |
| සං.වෙ.පවතින රටවල් | ඉන්දියාව, ශ්‍රී ලංකාව, මාලදිවයින, බංග්ලාදේශය, ආදී රටවල් | සප්තා සංවිධානය |
| ඛනිජ තෙල් අපනයනය කරන රටවල් | ඉරානය, ඉරාකය, සෞදි අරාබිය ආදී රටවල් | ඔපෙක් සංවිධානය |

**ක්‍රියාකාරකම්**


පහත සඳහන් කරුණු යටතේ ඔබේ තොරතුරු ගොනුව සංවර්ධනය කර ගන්න.

- රටවල් අතර වෙළෙඳාම තහවුරු කර ගැනීමට පිහිටුවා ගත් ජගත් සංවිධාන 2ක් කලාපීය සංවිධාන 2ක් හා වෙළෙඳ ගිවිසුම් 2ක් ලියන්න.
- ඒ ඒ සංවිධානවලට අයත් රටවල් 5 බැගින් ලෝක සිතියමක ලකුණු කරන්න.

ඉහත සංවිධාන හා ගිවිසුම්වලින් ශ්‍රී ලංකාවට ලැබී ඇති ප්‍රතිලාභ ලැයිස්තු ගත කරන්න.

## 7.2 ප්‍රවාහනය

මිනිසුන් හෝ භාණ්ඩ තැනක සිට තවත් තැනකට ගෙන යාම ප්‍රවාහනය නම් වේ. ලෝකයේ ප්‍රධාන ප්‍රවාහන මාධ්‍ය කීපයක් පහත සටහනේ දැක්වේ.





## ගොඩබිම් ප්‍රවාහනය


අතීතයේ ප්‍රවාහනය සඳහා මිනිස් ශ්‍රමය හා සත්ත්ව ශ්‍රමය (පුහුණු කළ සතුන් ගවයින් පක්ෂීන්,අශ්වයින්) යොදා ගනු ලැබුව ද, නූතන ලෝකයේ දියුණු මෙවලම් මෙම කාර්යය සඳහා භාවිත කෙරේ. පැරණි මෙවලම් ක්‍රම හා නූතන ප්‍රවාහන මෙවලම් මඟින් ද සිදු කරනු ලබන්නේ පොදුවේ භාණ්ඩ හා මගී ප්‍රවාහනය යි. ප්‍රවාහන මාධ්‍යයන්ගේ ගුණාත්මක සංවර්ධනය අනුව ගොඩබිම් ප්‍රවාහන මාධ්‍යයන් ගණනාවක් ම හඳුනාගත හැකි ය. මිනිස් ශ්‍රමය, සත්ත්ව ශ්‍රමය, දුම්රිය, මෝටර් රථ, නළ හා රැහැන් ද ඊට නිදසුන් කීපයකි.

## සත්ත්ව ශ්‍රමය


නූතන තාක්ෂණයේ දියුණු ප්‍රවාහන ක්‍රම භාවිත කිරීම නිසා සත්ත්ව ශ්‍රමය භාවිත කිරීම බෙහෙවින් අඩු වුව ද, භෞතික පරිසරය කටුක කඳුකර ප්‍රදේශ හා කාන්තාර ප්‍රදේශවල ප්‍රවාහනය සඳහා සතුන් භාවිත කිරීම වර්තමානයේ දී ද දක්නට ඇත. ඒ බව පහත දැක්වෙන රූපවලින් සනාථ වේ.



7.2 රූපය : ඔටුවන් පරිවහනයට යෙදවීම



7.3 රූපය : ගැල් මඟින් පරිවහනය



7.4ඃ රූපයඃ සතුන් පරිවහනය සඳහා යෙදවීම

## නළ මඟින් ප්‍රවාහනය

ජලය, ඛනිජ තෙල්, ගෑස් වැනි දෑ පරිවහනය සඳහා නළ මාර්ග යොදා ගැනේ. ඛනිජ තෙල් ප්‍රවාහනය සඳහා නළ මාර්ග භාවිත කර ඇති අයුරු 7.5 රූපයෙන් අනාවරණය වේ.



7.5 රූපයඃ : නළ මඟින් ප්‍රවාහනය

## බවුසර් මඟින් ප්‍රවාහනය

ජලය, ඛනිජ තෙල් වැනි දෑ කෙටි දුරක් ප්‍රවාහනය කිරීමේ දී නළ ප්‍රවාහනයට අමතර ව ගොඩබිම් ප්‍රදේශවල බවුසර් ද යොදා ගැනේ. ගොඩබිම් ප්‍රදේශවල ඛනිජ තෙල් ප්‍රවාහනය සඳහා යොදා ගන්නා බවුසරයක රූපයක් අංක 7.6 හි දක්වේ. මීට අමතර ව කිරි, ජලය, ගෑස්, රසායනික ද්‍රව්‍ය වැනි දෑ ප්‍රවාහනයට ද බවුසර් යොදා ගැනේ.




7.6 රූපය : ඛනිජ තෙල් ප්‍රවාහනය කරන බවුසරයක්



7.7 රූපය : අධිබල විදුලි රැහැන්

## රැහැන් මඟින් ප්‍රවාහනය

විදුලිය, උත්පාදන මධ්‍යස්ථානවල සිට ප්‍රාදේශීය බෙදා හැරීමේ මධ්‍යස්ථාන, කර්මාන්ත, පාරිභෝගික ස්ථාන කරා ප්‍රවාහනය කිරීම රැහැන් මඟින් සිදු වේ. ඇතැම් දුෂ්කර කඳු ප්‍රදේශවල මගී ප්‍රවාහනය සඳහා ද රැහැන් භාවිත වේ.

## දුම්රිය ප්‍රවාහනය

විශාල බඩු ප්‍රමාණයක් හා මගීන් ප්‍රමාණයක් එකවර ප්‍රවාහනයේ දී ලාබදායී ප්‍රවාහන මාධ්‍යයක් වේ. මහා සම්බීරියන් දුම්රිය මාර්ගය ඊට නිදසුන් වේ. සංවර්ධිත රටවල් කාර්මික අමුද්‍රව්‍ය සහ බැර භාණ්ඩ ප්‍රවාහනය සඳහා දුම්රිය බෙහෙවින් ම ප්‍රයෝජනයට ගනී. සංචාරක කර්මාන්තයේ දී සුඛෝපභෝගී ප්‍රවාහන මාධ්‍යයක් වේ. බ්‍රිතාන්‍ය යටත් විජිත වශයෙන් පැවති සංවර්ධනය වෙමින් පවතින රටවල දුම්රිය ප්‍රවාහනය දියුණු මට්ටමක පවතී. නිදසුන් ලෙස ඉන්දියාව, ශ්‍රී ලංකාව, බුරුමය දැක්විය හැකි ය. සංවර්ධිත රටවල මාර්ග තද බද සහිත ලන්ඩන්, පැරිස් වැනි නගරවල උමං දුම්රිය මාර්ග භාවිතය සුලබ ව සිදු වේ.

## බහාලුම් මඟින් ප්‍රවාහනය



7.8 රූපය : භාණ්ඩ ප්‍රවාහන ට්‍රක් රථයක්

භාණ්ඩ ප්‍රවාහනයේ කඩිනම් හා ආරක්ෂාකාරී ප්‍රවාහන ක්‍රමවේදයක් ලෙස මුහුදු හා ගොඩබිම් ප්‍රවාහනයේ දී බහාලුම් යොදා ගැනේ. බහාලුම් ප්‍රවාහනය සඳහා සුවිශේෂ නැව් හා ට්‍රක් රථ ප්‍රයෝජනයට ගැනේ. බහාලුම් භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගැනෙන විශාල ප්‍රමාණයේ ට්‍රක් රථයක් 7.8 රූපයෙන් දැක්වේ.

## නාවික ප්‍රවාහනය


අන්තර්ජාතික වෙළඳාමේ දී වැඩි වශයෙන් ම භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගැනෙන්නේ නාවික ප්‍රවාහනය යි. ගොඩබිම දුම්රිය ප්‍රවාහනයට ද වඩා ලාබදායී ප්‍රවාහන මාධ්‍යයක් වේ. වර්තමානයේ ලොව බොහෝ රටවල් භාණ්ඩ ප්‍රවාහනය සඳහා බහාලුම් නැව් යොදා ගැනේ. මීට අමතර ව විශේෂ පරමාර්ථ සඳහා යොදවන නැව් ද හඳුනාගත හැකි ය. යුධ කටයුතු සඳහා යොදවනු ලබන නැව් අති සුඛෝපභෝගී මගී ප්‍රවාහන නැව් ඊට නිදසුන් වේ. 7.9 සහ 7.10 රූපවලින් එවැනි සුවිශේෂ නාවික යාත්‍රා දෙකක් දැක්වේ.



7.9 රූපය : බහාලුම් ප්‍රවාහන නැවක්



7.10 රූපය : අති සුඛෝපභෝගී ප්‍රවාහන නැවක්




7.4 සිතියම : ලෝකයේ ප්‍රධාන නැව් මාර්ග

මූලාශ්‍රය-: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2005, මානුෂ භූගෝල විද්‍යාව I කොටස

## ලෝකයේ ප්‍රධාන නැව් මාර්ග

භාණ්ඩ හුවමාරු වන ධාරිතාව අනුව හා වාර්ෂික ව ගමන් කරන නාවික යාත්‍රා ගණන අනුව ලොව ප්‍රධාන නැව් මාර්ග පෙළගස්වා ඇති අයුරු 7.4 සිතියමෙන් අධ්‍යයනය කළ හැකි ය.

1. උතුරු අත්ලන්තික් මාර්ගය (යුරෝපය සහ ඊසාන දිග උතුරු ඇමරිකාව සම්බන්ධ කෙරේ).
2. පැනමා මාර්ගය (මධ්‍යම ඇමරිකාව, අත්ලන්තික් හා පැසිෆික් සාගර සම්බන්ධ කෙරේ).
3. සුභ පැත්මේ තුඩුව හරහා වැටී ඇති මාර්ගය (සුවස් ඇළ හරහා කෙටි මාර්ගය නිසා මෙහි වැදගත්කම අද අඩු වී ඇත.)
4. ද. අත්ලන්තික් මාර්ගය (වයඹදිග යුරෝපය හා දකුණු ඇමරිකාව සම්බන්ධ කරන මාර්ගය)
5. සුවස් ඇළ මාර්ගය (යුරෝපීය රටවල් ආසියාව හා ඕස්ට්‍රේලියාව සමග සම්බන්ධ කෙරේ).
6. අන්තර් පැසිෆික් මාර්ගය (පැසිෆික් සාගරයේ දෙපස සම්බන්ධ කෙරේ).

**ක්‍රියාකාරකම:**
පහත දැක්වෙන වගුව අභ්‍යාස පොතට පිටපත් කර ගෙන සම්පූර්ණ කරන්න.

| ප්‍රධාන නැව් මාර්ග | සම්බන්ධ වන මහාද්වීප/ රටවල් | ඒ ඒ නැව් මාර්ගයට සම්බන්ධ වන ප්‍රධාන වෙළෙඳ වරායන් |
|---|---|---|
| 1.<br>2.<br>3.<br>4.<br>5. | | |

## ගංගා හා ජල මාර්ග ආශ්‍රිත පරිවහනය

### ගංගා ආශ්‍රිත පරිවහනය

ගංගා පරිවහනයේ දී ගංගාවේ දිග, ගැඹුර, පළල, ජල පරිමාව, ගංගාවන් හරහා වැටී ඇති මහා මාර්ගවලට යෙදූ පාලම්, ජල දූෂණය, ඉවුරු ඛාදනය වැනි සාධක ද ඒවා ගලා යන්නේ ජනාධික ප්‍රදේශ හරහා ද වැනි සාධක රාශියක් බලපායි.

ශාන්ත ලෝරන්ස්, මිසිසිපි, රයින්, ඩැනියුබ්, ගංගා හා සින්ධු, හොවැංහෝ, යැංසිකියැං යන ගංගා පරිවහන කටයුතු සඳහා බහුල වශයෙන් යොදා ගැනේ. ගංගා පරිවහන පහසුකම් ප්‍රයෝජනයට ගනිමින් කර්මාන්ත ස්ථානගත වීමේ නැඹුරුවක් ද දක්නට ඇත. ජර්මනියේ රයින් ගඟ ඊට කදිම නිදසුනකි.

### විල් ආශ්‍රිත ජල පරිවහනය

මෙහි දී උතුරු ඇමරිකාවේ පංචමහා විල් ප්‍රධාන වේ. විල් අවට පිහිටි යපස්, ගල් අඟුරු, හුණු ගල්, කර්මාන්ත කරා ඒකරාශී කර ගැනීමේ ලාබදායී පරිවහන මාධ්‍යයක් ව ඇත. ඩෙට්රොයිට් කාර්මික නගරය ඊට හොඳ ම නිදසුනකි.

### ඇළ මාර්ග ආශ්‍රිත ජල පරිවහනය

චීනය, නෙදර්ලන්තය, ඇමරිකා එක්සත් ජනපදය, ජර්මනිය හා බ්‍රිතාන්‍ය වැනි රටවල් පරිවහන කටයුතු සඳහා ඇළ මාර්ග සුවිශේෂ ව භාවිත කරනු ලබයි. චීනයේ බීජිං නුවර නගර අභ්‍යන්තර සාප්පු සංකීර්ණ සම්බන්ධ කරනුයේ ඇළ මාර්ග ජාලයකිනි. වෙනිසියේ ගොන්ඩෝලා යාත්‍රා මඟින් කෙරෙන පරිවහනය වෙළෙඳ හා සංචාරක කටයුතුවල දී වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබයි 7.11 රූපයෙහි දැක්වෙන්නේ වැනිසියේ ජල මාර්ගයක් දෙපස පිහිටි ගොඩනැගිලි හා සාප්පු සංකීර්ණ ය. මුහුදු මාර්ග කෙටි කිරීමට ඉදි කළ ඇළ මාර්ග ද නාවික ගමන් කඩිනම් කිරීමට බොහෝ දුරට ඉවහල් වී ඇත.



7.11 රූපය : වැනීසියේ ඇළ මාර්ග

## ඇළ මාර්ගවල වැදගත්කම

7.1 වගුව : ඇළ මාර්ග

| සම්බන්ධ වන සාගර හෝ මුහුදු | | ඇළේ නම | ඉදිකළ වර්ෂය | ඇළේ දිග |
|---|---|---|---|---|
| ෆැසිපික් | අත්ලාන්තික් | පැනමා ඇළ | 1969 | 80km |
| රතු මුහුද | මධ්‍යධරණී මුහුද | සුවස් ඇළ | 1914 | 160km |

**ක්‍රියාකාරකම:**


- ලෝකයේ ප්‍රධාන නැව් මාර්ග ආශ්‍රිත ව පිහිටි වෙළෙඳ වරායන් පහක් පරිවහනයට යොදා ගැනෙන ප්‍රධාන ගංගා පහක්, ලෝකයේ ප්‍රධාන නැව් මාර්ග පහක්, සූවස් ඇළ හා පැනමා ඇළ ලෝක සිතියමක ලකුණු කර නම් කරන්න.

## ගුවන් පරිවහනය




7.12 රූපය : මගී ප්‍රවාහන ගුවන් යානයක්

වියදම් අධික කඩිනම් ප්‍රවාහන සේවයකි. නූතන ලොව අත්‍යවශ්‍ය පරිවහන මාධ්‍යයක් බවට පත්වී හමාර ය. අවශ්‍යතාවන් අනුව ගන්නා ප්‍රයෝජන ද විවිධ වේ. රටක ආර්ථික ශක්තිය විදහා පාන ප්‍රවාහන මාධ්‍යයක් ලෙස ද හඳුන්වා දීම නිවැරදි ය.





7.5 සිතියම : ලෝකයේ ප්‍රධාන ගුවන් මාර්ග

මුලාශ්‍රය : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව 9 ශ්‍රේණිය සමාජ අධ්‍යයනය හා ඉතිහාසය 2005

### ගුවන් පරිවහනයේ වැදගත්කම හඳුනා ගනිමු.

- මගී ප්‍රවාහනයේ මාධ්‍යයක් ලෙස වැදගත් වීම.
- අන්තර්ජාතික ප්‍රවාහනයේ දී කඩිනම් ප්‍රවාහන මාධ්‍යයක් වීම.
- ඉක්මනින් ප්‍රවාහනය කළ යුතු භාණ්ඩ ප්‍රවාහනයට වැදගත් වීම. (බෙහෙත්, මල්)
- ගොඩබිමින් හෝ ජලයෙන් හෝ ළඟා විය නො හැකි ස්ථානවලට ළඟා විය හැකි වීම.
- යුධ කටයුතු, තැපැල්, අභ්‍යවකාශ පර්යේෂණ, ගුවන් ඡායාරූප ගැනීම සඳහා හොඳ මාධ්‍යයක් වීම.
- භූමියේ පවතින භෞතික බාධාවන් පහසුවෙන් ජයගත හැකි වීම. උදා: කඳු, ගංගා, වගුරු
- ගුවන් තොටුපළ, වෙළෙඳ මධ්‍යස්ථාන වඩාත් වැදගත් කිරීමට දායක වීම.


ගොඩ, ජල හා ගුවන් වශයෙන් පරිවහන මාධ්‍යයන් තුනක් ලෙස අධ්‍යයනයේ පහසුවට හඳුනා ගැනීමට උත්සහ දැරුව ද ලොව බොහෝ රටවල මාර්ග ජාල හඳුනා ගත හැකි යි. දුම්රිය, මෝටර් රථ, ගුවන්, නාවික ප්‍රවාහනය ඒකාබද්ධ සේවාවක් ලෙස දියුණු රටවල නගර ප්‍රයෝජනයට ගනී. පහත දැක්වෙන සිතියම අධ්‍යයනය කිරීමේ දී ඒ බව තහවුරු වේ.



**7.6 සිතියම : උතුරු ඇමරිකාවේ චිකාගෝ ඩිට්‍රොයිට් නගර හා උප නගර**

මූලාශ්‍රයඃ එම්. ඩී ගුණසේන, 2003 ,නවීන ගුණසේන  ෆිලිප් ලෝක සිතියම් පොත

ඉහත සිතියමේ මාර්ග ජාලය අධ්‍යයනය කිරීමේ දී මාර්ග වර්ග කීපයක් එකට බද්ධ ව  ඇති බව අනාවරණය වනු ඇත. චීනයේ, බීජිං නගරය හා අවට උපනගර; මොස්කව් හා උපනගර; පැරිස් හා සම්බන්ධ අවට උපනගර මෙයට උදාහරණ ලෙස දැක්විය හැකි ය.



7.13 රූපය : සංවර්ධිත රටක මහා මාර්ග ජාලයක්

අධික ජන සංඛ්‍යාවක් හා මාර්ග තද බද සහිත ප්‍රධාන නගරවල නොයෙක් දිශාවන්ට දිවෙන විවිධ ස්තර ඔස්සේ ගමන් කරන මාර්ග ජාල රටාවන් ප්‍රයෝජනයට ගැනේ. එවැනි මාර්ග රටාවක් 7.13 රූපයෙ හි දැක්වේ. මාර්ග තද බදය අවම කර ගැනීමටත්, කාලය ඉතිරි කර ගැනීමටත් දියුණු ප්‍රවාහන ක්‍රමවේද ලොව බොහෝ සංවර්ධිත රටවල් ප්‍රයෝජනයට ගනී.

**ක්‍රියාකාරකම**
පහත දැක්වෙන වගුව අභ්‍යාස පොතට පිටපත් කර ගෙන සම්පූර්ණ කරන්න.


**තොරතුරු සොයමු ගොනුවක් සකසමු**

| ප්‍රවාහන මාධ්‍ය | ප්‍රවාහනය වන භාණ්ඩ වර්ගවලට නිදසුන් | බහුල ව භාවිත වන ප්‍රදේශ/රටවල් |
|---|---|---|
| මිනිසුන්ගේ ශ්‍රමය | ..........................................<br>..........................................<br>.......................................... | |
| සත්ත්ව ශ්‍රමය — අසුන්, ඇතුන්, ඔටුවන් | ..........................................<br>..........................................<br>.......................................... | |
| නළ මඟින් ප්‍රවාහනය | .......................................... | |
| රැහැන් (කේබල්)............................. | .......................................... | |
| ගංගා.................................................. | .......................................... | |
| සැකසූ ඇළ මාර්ග......................... | .......................................... | |
| බහාලුම්.............................................. | .......................................... | |
| බවුසර්................................................ | .......................................... | |
| දුම්රිය................................................. | .......................................... | |
| මෝටර් රථ.......................................... | .......................................... | |
| ගුවන්යානා...................................... | .......................................... | |
| නැව්................................................... | .......................................... | |

නිදසුන: **බවුසර්**: කිරි, ඉන්ධන, ගෑස්, ජලය, රසායන ද්‍රව්‍ය, **නැව්:** බඩු නැව්, තෙල් නැව්, සුඛෝපභෝගී නැව්, ධීවර නැව්, යුධ නැව්, පුස්තකාල, ශල්‍යාගාර රෝහල් සහිත නැව්, මගී නැව්.

## 7.3 සන්නිවේදනය

පුද්ගලයකු විසින් තවත් පුද්ගලයකුට හෝ පුද්ගලයන් සමූහයකට සිදු කරන පණිවිඩ හුවමාරුව සන්නිවේදනය නමින් හැඳින්වේ.




**සාර්ථක සන්නිවේදනයක් වීමට නම්..........................**


පණිවිඩය නිකුත් කරන ස්ථානයේ සිට ග්‍රහණය කර ගන්නා දක්වා

- ඇති විය හැකි අනතුරු, බාධා නොමැති වීම.
- ගතවන කාලය අඩු වීම.
- පණිවිඩය ගමන් කරන අදියර ගණන අඩු වීම.
- වියදම අඩු වීම.
- මුල් පණිවිඩයට එකතු වන අතුරු පුවත් භාෂා හෝ සංඥා ගැටලු අවම විය යුතු අතර විශ්වාසය තහවුරු විය යුතුයි.



7.14 රූපය : සන්නිවේදන මාධ්‍යය

**සන්නිවේදනයේ විවිධ මාධ්‍ය**



එද සහ අද සන්නිවේදන ක්‍රියාවලිය තුළ මුද්‍රිත සන්නිවේදන ක්‍රියාවලියට වඩා විද්‍යුත් සන්නිවේදනය විශාල ප්‍රගතියක් ලබා ඇත. විද්‍යුත් සන්නිවේදන මාධ්‍ය තුළ උපකරණ හා ක්‍රමවේදයන්ගේ ඉතා වේගවත් දියුණුව අනාගතයේ දී විශාල වෙනස්කම් ඇති කිරීමට සමත් වනු ඇත.

| විද්‍යුත් සන්නිවේදනයේ ප්‍රතිඵල | |
|---|---|
| **යහපත්** | **අයහපත්** |
| • වෙළෙඳාම, ප්‍රවාහනය සම්බන්ධ කරන මාධ්‍යයක් ලෙස ක්‍රියාත්මක වීම.<br>• තරගකාරි වෙළෙඳපොළ රටාවක් බිහි වීම.<br>• ලොව රටවල්, ප්‍රදේශ ගම්මාන ආදියේ භෞතික දුර ජය ගැනීම.<br>• කාලය ඉතිරි කර ගැනීමට හැකි වීම.<br>• අන්තර් පුද්ගල /ජාතික සබඳතා දියුණු වීම.<br>• තොරතුරු ඉක්මනින් ගලා යාම. | • ප්‍රතිෂ්ඨාපනය කිරීමේ වියදම් අධික වීම.<br>• සැමට පොදුවේ සේවයක් ලබා ගත නොහැකි වීම.<br>• භාෂාමය ගැටලු.<br>• පුහුණුවෙන් තොර වීමෙන් ඇති වන හානි.<br>• සමාජ සාරධර්මවලට පටහැනි ව ක්‍රියාත්මක වන අවස්ථා දක්නට ලැබීම.<br>• විද්‍යුත් මාධ්‍යය ඔස්සේ සම්ප්‍රේෂණය කරන වෙළෙඳ දැන්වීම් නිසා වෙළෙඳපොළ විකෘති කිරීම. |

**ක්‍රියාකාරකම:**

විද්‍යුත් සන්නිවේදනයේ වාසි අවාසි පහ බැගින් ලියන්න

**පැවරුම්**

විෂය භාර ගුරුතුමා / ගුරුතුමියගේ උදව් උපදෙස් ඇතිව පන්තිය ශිෂ්‍ය කණ්ඩායම් දෙකකට බෙදී විද්‍යුත් සන්නිවේදනය මානුෂ අන්තර් ක්‍රියාකාරිත්වයට හිතකර ද?..................අහිතකර ද? යන තේමාව යටතේ විවාදයක යෙදෙන්න.